# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2015 නොවැම්බර් මස 20 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2015.11.23 දින නිකුත් කරන ලදී)**

## ජයන්තිපුර සුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**ජයන්තිපුර සුභසාධක සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## ජයන්තිපුර සුහසාධක සංගමය (සංස්ථාගත කිරීමේ)

## ජයන්තිපුර සුහසාධක සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"බත්තරමුල්ල ජයන්තිපුර සුහසාධක සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ සංගමයේ කාර්යයන්, පරමාර්ථ හා ඊට සම්බන්ධ සියලු කාරණා ඵලදායී හා සාධනීය අයුරින් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා වර්ෂ 1969 දී, කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටුවා ඇති හෙයින් ද: පූර්විකාව.

ඒ සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද; ඒ සංගමය "සංස්ථාගත ජයන්තිපුර සුහසාධක සංගමය" යනුවෙන් සංස්ථාගත කරන ලෙස පසුව ඉල්ලීමක් කර ඇති හෙයින් ද; එකී ඉල්ලීමට අවසර දීම මහජන යහපත හා සුහසිද්ධිය පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2011 අංක    දරන ජයන්තිපුර සුහසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජයන්තිපුර සුහසාධක සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජයන්තිපුර සුහසාධක සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලු අධිකරණවල එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ජයන්තිපුර සුහසාධක සංගමය සංස්ථාගත කිරීම.

3. "සංස්ථාපිත ජයන්තිපුර සුහසාධක සංගමය" (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ජයන්තිපුර පදිංචිකරුවන්ගේ සංයුතියෙහි බහුවිධතාව හඳුනා ගනිමින්, සාමාජිකයන්ගේ හා ඔවුන්ගේ සැපෙන්නන්ගේ අන්‍යෝන්‍ය සුභසාධනය පිණිස පෙලඹවීම, පෝෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම;

(ආ) සාමාජිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම්, ස්වාධීනතා හා වරප්‍රසාද ආරක්ෂා කිරීම හා රැක ගැනීම;

(ඇ) සාමාජිකයන් ජීවත් වන පරිසරය ආරක්ෂා කිරීම සහ ඊට අහිතකර බලපෑමක් සිදු නොවන බවටත්, ස්වාභාවික වටපිටාව, තුරුලතා හා තෙත්බිම් හිතුවක්කාරී ලෙස විනාශ කිරීමක්, ඒවාට හානි කිරීමක් හෝ සිතුමැති ආකාරයෙන් බාධා කිරීමක් හෝ ඒවා අයුතු ලෙස ඈඳා ගැනීමක් සිදු නොවන බවටත්; ඔවුන් ජීවත් වන හිතකර වාතාවරණය කෙරෙහි අහිතකර බලපෑමක් සිදු නොවන බවටත් වගබලා ගැනීම;

(ඈ) ස්වාභාවික ව්‍යසන, ජල ගැලීම්, සුළිසුළං, භූමිකම්පා, ගිනි ගැනීම් හා එවැනි අනෙකුත් සියලු ස්වාභාවික ආපදාවන් සිදුවන අවස්ථාවල දී සාමාජිකයන් ඔවුන්ගේ පවුල් හා මහජනතාව ආරක්ෂා කිරීම, රැක ගැනීම සහ ඔවුන්ට පිහිටවීම;

(ඉ) සිය පාලනයෙන් තොර සාධක හේතුවෙන් සාමාජිකයන්ගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව කෙරෙහි බලපෑමක් සිදු නොවන බව තහවුරු කිරීම හා සාමාජිකයන්ගේ හා කලාපීය ජනතාවගේ උපරිම සුභසිද්ධිය පිණිස අදාළ සියලු ම පරිපාලන බල අධිකාරීන් විසින් සිය කාර්යයන් හා වගකීම් ඵලදායී ලෙස ඉටු කරනු ලබන බව තහවුරු කිරීම;

(ඊ) ගිනි ගැනීම්, ජල ගැලීම් හෝ ස්වාභාවික අපදාවන්වලට එරෙහිව සෞඛ්‍ය රක්ෂණ, ජීවිත රක්ෂණ, සමාජ රක්ෂණ, අනතුරු රක්ෂණ හා සමූහ නිවාස රක්ෂණ යෝජනා ක්‍රම, සාමූහික හෝ වෙන් වෙන් වශයෙන් සාමාජිකයන් වෙත සලසා දීම, ඒවා ප්‍රවර්ධනය කිරීම;

(උ) බත්තරමුල්ල - කඩුවෙල ප්‍රදේශවාසීන් සඳහා ගිලන්රථ සේවාවක් පිහිටුවීමට සහ එකී ප්‍රදේශය සඳහා ප්‍රජා

මධ්‍යස්ථානයක්, දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්, පෙර පාසලක්, ශාරීරික ව්‍යායාම් මධ්‍යස්ථානයක් හා වැඩිහිටි හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නිවාසයක් පිහිටුවීමට මූලික පියවර ගැනීම සහ ඒ සඳහා රජයේ හා රාජ්‍ය නොවන සංවිධානවල ආධාර ලබා ගැනීම;

(ඍ) පවත්නා හා ඇතිවිය හැකි සෞඛ්‍ය අනතුරු පිළිබඳව සොයා බැලීම පිණිස කලින් කල සායන පැවැත්වීම සහ අදාළ රජයේ හා රාජ්‍ය නොවන ආයතනවලින් නොමිලේ හෝ සහන මිල ගණන් මත සෞඛ්‍ය පහසුකම් හා ද්‍රව්‍ය ලබා ගැනීමට සාමාජිකයන්ට හා ඔවුන්ගේ පවුල්වලට සහාය වීම;

(එ) සාමාජිකයන්ගේ හා සුභපතන්නන්ගේ පරිත්‍යාග මෙන් ම රජයේ, පළාත් පාලන ආයතනයන් හා රාජ්‍ය නොවන සංවිධානවල ආධාර මත සංස්ථාව සඳහා ඉඩකඩ ඇති අංග සම්පූර්ණ මූලස්ථානයක් ඉදිකිරීම පිණිස අරමුදලක් ඇති කිරීම සහ එම මූලස්ථානයේ:—

(i) කාර්යාලයක්, පුස්තකාලයක් හා කියවීම් ශාලාවක් ද, ශ්‍රවනාගාරයක්, සංස්කෘතික කටයුතු, ප්‍රිය සම්භාෂණ හා ගෘහස්ථ ක්‍රීඩා සඳහා ශාලාවක්;

(ii) සාමාජිකයන්ගේ පවුල්වල හා කලාපයේ පාසල් හැර ගිය, රැකියා විරහිත හා උගත් තරුණ පිරිස් ඵලදායි රැකියා ලබාගැනීමට හා ස්වයංරැකියා ව්‍යාපෘති සඳහා පුහුණු කරවීමට පරිගණක හා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් තිබිය යුතු වීම;

(ඒ) මූලික වශයෙන් සාමාජිකයන්ගේ හා බත්තරමුල්ල-කඩුවෙල කලාපයේ පාසල් හැරගිය හා උගත් රැකියා විරහිත තරුණ පිරිසේ සුභසිද්ධිය පිණිස වෘත්තීය පුහුණු යෝජනා ක්‍රම සංවිධානය කිරීම සහ ඒ සඳහා ඔවුන් උනන්දු කරවීම;

(ඔ) සාමාජිකයන් හට අතිරේක ආදායම් මූලාශ්‍රයක් විය හැකි රුක්රෝපණ වැඩසටහන් හා ගෙවතුවල භෝග වගා කිරීමට ආධාර කිරීම;

(i) රැකියාවෙන් ඉවත්වූවන් හා විශ්‍රාමිකයන් සහ වැඩිහිටියන් වශයෙන් සිය අයිතිවාසිකම් තහවුරු කර ගැනීම හා ඔවුන්ට ලැබිය යුතු දෑ ලබා ගැනීම

පිණිස රැකියාවෙන් ඉවත්වූවන්, විශ්‍රාමිකයන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යථා පරිදි සංවිධානගත වීම අරභයා ඔවුනට සහාය වීම සහ ඔවුන්ට ලැබිය යුතු පාරිතෝෂික, විශ්‍රාම වැටුප් අර්ථසාධක අරමුදල්වල පවත්නා කවර හෝ විෂමතාවන් නිවැරදි කර ගැනීමට ඔවුන්ට සහාය වීම සහ සංස්ථාවේ සාමාජිකයන් වන එවැනි තැනැත්තන් සඳහා පොදුවේ ආධාර කිරීම;

(ii) සංස්ථාව විසින් දැනටමත් පිහිටුවා ඇති මරණාධාර යෝජනා ක්‍රමය ඉදිරියටත් කරගෙන යාම සහ ශෝකප්‍රාප්ත පවුල් සඳහා හැකි සෑම අයුරකින් ම ආධාර කිරීම;

(ඕ) නිසි ආලෝකකරණ, මාර්ග නඩත්තු හා සෙසු පහසුකම් සලසා දීම මගින් ජයන්තිපුර නිවාස යෝජනා ක්‍රමය තව දුරටත් සංවර්ධනය කිරීම පිණිස අදාළ බලධාරීන් උනන්දු කරවීම; සහ

(ක) දැන් සංස්ථාව යයි හඳුන්වනු ලබන සංගමයේ පරමාර්ථ හා අරමුණු ඉටු කිරීම හෝ මුදුන්පමුණුවා ගැනීම පිණිස අවශ්‍ය වන හා ආනුෂංගික හෝ උපස්ථම්භක වන සියලු කටයුතු, කාරණා හා කාර්යයන් කිරීම, ඉටු කිරීම හා ක්‍රියාත්මක කිරීම.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

**4.** (1) සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සංස්ථාව විසින් නියම කරනු ලබන රීතිවලට යටත්ව, මෙම පනතේ හා සංස්ථාවේ රීතිවල විධිවිධානවලට අනුව සංස්ථාවේ සාමාජිකයන්ගේ මහා සභා හෝ විශේෂ මහා සභා රැස්වීමක දී යථා පරිදි තෝරා පත්කර ගනු ලබන නිලධරයන් සහ සෙසු සාමාජිකයන් ගණනකින් සමන්විත වන්නා වූ කළමනාකරණ මණ්ඩලයක් මගින් කරනු ලැබිය යුතු ය.

(2) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දැරූ සංගමයේ කළමනාකරණ කමිටුව සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය වන්නේ ය.

(3) කළමනාකරණ මණ්ඩලයේ යම් සාමාජිකයකු ඉවත් කරනු ලැබීම, ඉල්ලා අස්වීම හෝ ඔහුගේ මරණය සිදු වූ අවස්ථාවක එමගින් ඇති වන පුරප්පාඩුව මෙම පනතේ විධිවිධාන සහ තත්කාලයේ පවත්නා රීතිවලට අනුකූලව පුරවනු ලැබිය යුතු ය.

දේපළ අත්කර ගැනීමට, අරමුදල් ආයෝජනයට හා ණය ලබා ගැනීමට සංස්ථාව සතු බලතල.

**5.** මෙම පනතේ සහ අන් කවර හෝ ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව:—

(අ) සංස්ථාවේ කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි ඉඩම් හෝ ගොඩනැගිලි මිළ දී ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදි කිරීමට සහ අන්‍යාකාරයෙන් ලබා ගැනීමට;

(ආ) සංස්ථාවේ කිසිදු දේපළකට අගතියකින් තොරව සංස්ථාවේ කාර්යයන් සඳහා රජය අනුමත කළ (දේශීය හා විදේශීය) බැංකු හා ආයතන වෙතින් මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට;

(ඇ) සංස්ථාවේ නිලධාරීන්, සේවානියුක්තිකයන් හෝ සේවකයන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ සංස්ථාව විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඔවුන්ට වැටුප්, දීමනා හා පාරිතෝෂික ආදිය ගෙවීම;

(ඈ) සංස්ථාවේ කවර හෝ සියලු හෝ පරමාර්ථ සහ එකී සංස්ථාවේ සාමාජිකයන්ගේ සුභසාධනය සාක්ෂාත්කර ගැනීම පිණිස, දේශිය මෙන් ම විදේශීය රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පළාත් පාලන හෝ රාජ්‍ය නොවන සංවිධානවල ආධාර හා සහයෝගය අපේක්ෂා කිරීම;

(ඉ) සංස්ථාවේ සාමාජිකයන්හට මෙන් ම එවන් සේවාවන් අවශ්‍ය වන පොදු ජනතාව හට අර්ථදායක සමාජ සේවාවන් සලසා දීම;

(ඊ) කවර හෝ පුද්ගලයෙක් හෝ පුද්ගලයන්, පුද්ගල මණ්ඩලයක්, ආයතන, සමාගම්, සංස්ථා ආදිය සමග ගිවිසුම්වලට එළඹීම;

(උ) නියම කර ඇති නියමයන් හා කොන්දේසි මත, සාමාජික ඇතුළත්වීමේ ගාස්තු හෝ සංගමයේ (සංස්ථාවේ) සාමාජිකයන්ව සිටි පුද්ගලයකු හෝ පුද්ගලයන් සඳහා නැවත ඇතුළත්වීමේ ගාස්තු අය කිරීම;

(ඌ) බැංකු ගිණුම් විවෘත කිරීමට, මෙහෙයවීමට, පවත්වාගෙන යාමට හා වසා දැමීමට;

(එ) සංස්ථාවේ කාර්යයන් සඳහා වහා අවශ්‍ය නොවන කවර හෝ අරමුදල් මණ්ඩලය සුදුසු යයි හිතන ආකාරයට ආයෝජනය කිරීමට;

(ඒ) සියලු ආකාරයේ දායක මුදල්, ප්‍රදාන, පරිත්‍යාග හා ත්‍යාගයන් ඉල්ලා සිටීමට හා ලබා ගැනීමට; සහ

(ඔ) සංස්ථාවේ පරමාර්ථ නිසි පරිදි හා ඵලදායි ලෙස ඉටු කිරීම පිණිස අවශ්‍ය වන හෝ අවස්ථානුකූල සෙසු සියලු දේ කිරීමට

බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් සංස්ථාවේ යම් රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත සඳහන් කාරණා සඳහා මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්ව වර්ගීකරණය, එක් එක් සාමාජික පන්තිය විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, අස් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) කළමනාකරණ මණ්ඩලය තෝරා පත්කර ගැනීම හෝ නිලධරයන් වශයෙන් සිය නිලය අත්හැරීම හෝ නිලයෙන් පහ කිරීම, බලය පැවරීම සහ කළමනාකරණ මණ්ඩලයේ කාර්යයන් හා චර්යාව;

(ඇ) සංස්ථාවේ විවිධ කමිටු, අනුකමිටු, නියෝජිතයන් හා සේවකයන් පත් කිරීම, ඔවුනට බලතල පැවරීම, ඔවුනගේ කාර්යයන්, කර්තව්‍යයන් හා චර්යාව;

(ඇ) සංස්ථාවේ, කළමනාකරණ මණ්ඩලයේ හෝ එහි කවර හෝ අනුකමිටුවල රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, පුරප්පාඩු පිරවීම, ඒ රැස්වීම් පිළිබඳ නිවේදන හා න්‍යාය පත්‍රය, ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) කළමනාකරණ මණ්ඩලයේ හා සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම්; සහ

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සහ පොදුවේ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම.

(2) සංස්ථාවේ යම් මහා සභා හෝ විශේෂ රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මිස තත්කාලයේ බලාත්මකව පවත්නා සංස්ථාවේ කිසිදු රීතියක් හෝ මින් මතු සම්මත කරනු ලැබිය හැකි කවර හෝ රීතියක් වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම නොකළ යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව ම වූ දිනයේ බලාත්මකව පැවති සංස්ථාවේ රීති මේ පනතේ හෝ අන් කවර හෝ ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන්නේ නම් ඒ රීති මේ වගන්තිය යටතේ සාදන ලද රීති සේ සැලකිය යුතු ය;

(4) සංස්ථාවේ සාමාජිකයන් තත්කාලයේ බලාත්මකව පවත්නා සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, පරිත්‍යාග, ත්‍යාග, තෙස්තමේන්තු බැහැර දීම, පැවරීම, දායක මුදල් හෝ ගාස්තු වශයෙන් සංස්ථාවට ලැබෙන සියලු මුදල් කළමනාකරණ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීමේ, සංවර්ධනය කිරීමේ හෝ වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා සංස්ථාව විසින් ක්ෂය අරමුදලක් හෝ නිදන් අරමුදලක් පිහිටුවිය හැකිය.

(3) ස්වකීය බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් සඳහා ගෙවිය යුතු සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

විගණනය සහ ගිණුම්.

8. (1) කළමනාකරණ මණ්ඩලය විසින් සංස්ථාවේ සියලු ආදායම් සහ වියදම් පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම්, කළමනාකරණ මණ්ඩලය විසින් පත්කරනු ලබන ලියාපදිංචි විගණකවරයකු හෝ වරලත් ගණකාධිකාරිවරයකු හෝ වරලත් ගණකාධිකාරි සමාගමක් ලවා වාර්ෂිකව විගණනය කළ යුතු ය.

මුදල් සහ දේපළ යොදවා ගැනීම.

9. කුමන හෝ ආකාරයකින් උපයාගත් සංස්ථාවේ මුදල් සහ දේපළ හුදෙක් මෙහි දක්වා ඇති ස්වකීය පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම පිණිස ම යොදවා ගත යුතු අතර, ඒවායින් කවර හෝ කොටසක් ලාභාංශ, ප්‍රසාද දීමනා, ලාභ හෝ කවර හෝ අන්‍යාකාරයකින් සංස්ථාවේ සාමාජිකයන් වෙත ගෙවීම හෝ ඍජුව හෝ වක්‍රව පැවරීම නොකළ යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

10. කළමනාකරණ මණ්ඩලයේ යෝජනා සම්මතයකින් ලබා දී ඇති අධිකාරී බලය මත කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙක් සහ මහ ලේකම් හෝ අදාළ කාර්යය සඳහා කළමනාකරණ මණ්ඩලය විසින් පත්කරනු ලැබිය හැකි එවැනි වෙනත් නිලධරයෙක් ඉදිරිපිට දී, මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඉහත කී කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් සහ මහ ලේකම් හෝ අනිකුත් නිලධරයා විසින් තමන් ඉදිරිපිට දී සංස්ථාවේ මුද්‍රාව තබනු ලබන සියලු සාධනපත්‍ර අත්සන් කරනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීම හෝ ඇවර කිරීම.

11. සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඇවර කිරීමේ දී එහි සියලු ණය සහ බැරකම් සහ අනුවැය පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත් ඒ දේපළ සංස්ථාවේ පරමාර්ථවලට සමාන

පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. මේ වගන්තියේ යථෝක්ත විධිවිධාන ප්‍රකාර යම් දේපළක් හෝ ඉන් කවර හෝ කොටසක් බැහැර කළ නොහැකි නම්, ඒ දේපළ හෝ එහි යම් කොටසක් කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු යම් පුණ්‍යමය පරමාර්ථයක් සඳහා යෙදවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** මේ පනතේ සඳහන් අයිතිවාසිකම් සහ ඒ අයිතිවාසිකම් මගින්, කරණකොට හෝ යටතේ හිමිකම්පාන අයිතිවාසිකම් හැර, ජනරජයේ හෝ කවර හෝ සංස්ථාවක හෝ අන් කවර හෝ පුද්ගලයකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.